17

L

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 12(1)

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-06-04 |

පැමිණිලිකරු : ඒ.එම් මෆ්රාස් කාන් මයා,
අංක 52, කුරුක්කුරාගම,
කහටගස්ගිදිලිය.

වගඋත්තරකරුවන් : ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරුමැද පළාත,
අනුරාධපුරය.

**පැමිණිලි අංකය : HRC/AP/459/2017**

ඉහත පැමිණිලිකරු විසින් 2017.10.09 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, උතුරුමැද පළාතේ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට පෙනී සිට අනතුරුව 2017.07.17 දින සම්මුඛ පරීක්ෂණයකටද පෙනී සිටින ලද බවත්, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලද්දේ තාක්ෂණවේදය විෂය (Technology) (දෙමළ මාධ්‍ය) සඳහා වන බවත්ය.

සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව පරීක්ෂණ මණ්ඩලය විසින් තමන් ඉහත විෂය සඳහා ගුරු පත්වීමක් ලබා ගැනීමට සුදුසුකම් ලබා නොමැති බවට නිර්දේශ කිරීමෙන් තමන්ට ගුරු පත්වීමක් නොලද බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ගැසට් නිවේදනයේ සඳහන්ව තිබූ තම සුදුසුකම් ඉදිරිපත් කළ නමුත් තම සුදුසුකම් නොසලකා කටයුතු කිරීමෙන් තමන්ට අසාධාරණයක් සිදුවූ බවය.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් දන්වා ඇත්තේ උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය 2017.03.18 දින පවත්වන ලද බවත්, පැමිණිලිකරු 2017.07.17 දින තාක්ෂණවේදය විෂය දෙමළ මාධ්‍යයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වී ඇති බවත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන අනුව පැමිණිලිකරු ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.**<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

නොමැති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති බවත් ඒ අනුව පැමිණිලිකරුට ගුරු පත්වීමක් ලැබී නොමැති බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

2017.01.23 වන දින තාක්ෂණවේදය විෂය දෙමළ මාධ්‍යයට අදාළව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ගුරු පත්වීමක් ලබාගැනීමට පැමිණිලිකරු සුදුසුකම් සපුරා නොමැති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර ඇති බව ලකුණු ලබා දීමේ ලැයිස්තුව අනුව නිරීක්ෂණය වේ.

'බඳවා ගැනීමේ පටිපාටිවලට ඇතුළත් කළ යුතු වෙනත් අධ්‍යාපනික සුදුසුකම්' මැයෙන් 1990 ඔක්තොම්බර් 30 දිනැති හා අංක 46/90 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, මෙම චක්‍රලේඛය මඟින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව බඳවා ගැනීමේ පටිපාටිවලට අදාළව වෙනත් අධ්‍යාපනික සුදුසුකම් ලෙස පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේදී ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDEC) හදාරා සහතිකයක් ලබා තිබීම ගුරු සේවයට ඇතුළත් වීමට සුදුසුකමක් සේ පිළිගෙන ඇති බවද ලේඛන අනුව නිරීක්ෂණය වේ. තවද මෙහි C යන්න S=science ලෙස නිවැරදි විය යුතු බව වගඋත්තරකරුවන් සඳහන් කර ඇත.

සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන විට පැමිණිලිකරු උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා ඇති අයකු බවට ඉදිරිපත් කර ඇති 2015.11.13 දිනැති සහතිකය අනුව අනාවරණය වන අතර, උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව රාජ්‍ය සේවයේ පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස සලකන බවට 2016 මාර්තු මස 01 වැනි අඟහරුවාදා දිනැති ගැසට් නිවේදනය සහ 2015 නොවැම්බර් මස 20 වැනි සිකුරාදා දිනැති ගැසට් නිවේදනය අනුව අනාවරණය වේ.

පැමිණිලිකරු ප්‍රධාන කොටම පැමිණිල්ල මඟින් කියා සිට ඇත්තේ, උතුරු මැද පළාත් ගුරු සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලබා සිටි තමන්ට ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කිරීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවය.

වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අවස්ථාවේදී සුදුසුකම් සපුරා නොසිටි බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර ඇති බැවින් ගුරු පත්වීමක් ලබා දී නොමැති බවය.

උතුරුමැද පළාතට උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත තරඟ විභාගයෙන් පැමිණිලිකරු සමත්ව 2017.07.17 වන දින තාක්ෂණවේදය විෂය (දෙමළ මාධ්‍ය) යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වී ඇත.

පැමිණිලිකරු ඔහු විසින් ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරු ගුරු පත්වීමක් ලබා ගැනීමට සුදුසුකම් ලබා නොමැති බවට වන නිර්දේශය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පාර්ශව කැඳවා 2018.01.08 වන දින කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් සිදුකර ඇති අතර පරීක්ෂණය සඳහා පෙනී සිටි වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ වයස් සීමාව නිවැරදි බවත් අ.පො.ස (උසපෙළ) සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, පැමිණිලිකරු ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර යොමු කළ තාක්ෂණ වේදය (දෙමළ මාධ්‍ය) විෂයට අදාළව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සුදුසුකම් පරීක්ෂා කර ඇත්තේ 1990 ඔක්තොම්බර් මස 30 දිනැති 46/90 දරණ චක්‍රලේඛයේ සඳහන් කරුණු සැළකිල්ලට ගනිමින් වන බවත්ය.

එමෙන්ම ඉහත චක්‍රලේඛය මඟින් උසස් ජාතික ඩිප්ලෝමාව ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවට සමාන වන බවට සඳහන් වන අතර, පැමිණිලිකරු විසින් HNDE සහතිකය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බවත්, නමුත් පැමිණිලිකරුගේ HNDE සහතිකය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සලකා බලා නොමැති බවටත් කරුණු නිරීක්ෂණය වේ. අංක 46/90 චක්‍රලේඛයේ සටහන යටතේ "මෙම සමීකරණය ඉගැන්වීමේ පත්වීම්වලට හැර අනෙකුත් සියලුම පත්වීම් වලට අදාළ වේ" යනුවෙන් සඳහන් වී තිබීම පත්වීමක් ලබා ගැනීමට නිර්දේශ නොවීමට හේතු වී ඇති බවද නිරීක්ෂණය වේ.

එමෙන්ම වගඋත්තරකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ගුරු පත්වීම් ලබාදීම සඳහා අයදුම්පත්‍ර කැඳවන අවස්ථාවේ තාක්ෂණවේදයට අදාළ ඩිප්ලෝමාධාරී අයදුම්කරුවන් සඳහා අදාළ සුදුසුකම වූයේ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හදාරා තිබිය යුතුය යන්න සඳහන් වන බවත්, පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය (HNDE) ඉදිරිපත් කර ඇති බවත්ය.

2017 වසරේ උතුරුමැද පළාතේ ගුරු පත්වීම් ලබාදීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට පැමිණිලිකරු සහභාගී වන අවස්ථාව වන විට අදාළ අයදුම්පත් කැඳවන ලද නිවේදනයේ සඳහන් තාක්ෂණවේදය විෂයට අදාළ ඩිප්ලෝමාධාරී අයදුම්කරුවන් සඳහා ඉල්ලා ඇති සුදුසුකම වන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) පැමිණිලිකරු විසින් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරුගේ මෙකී සුදුසුකම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව පිළිගෙන නොමැති බවද නිරීක්ෂණය වේ.

1990 ඔක්තොම්බර් මස 30 වන දිනැති 46/90 දරණ චක්‍රලේඛයේ සඳහන් කරුණු සැළකිල්ලට ගනිමින් ගුරු පත්වීමක් ලබාදීම සඳහා පැමිණිලිකරුව තෝරාගෙන නොමැති බවට

වගඋත්තරකරුවන් ප්‍රකාශයක් පමණක් කරන නමුත් මෙම චක්‍රලේඛය හා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී ප්‍රකාශයට පත්කරන ලද අයදුම්කරුවන්ගේ සුදුසුකම් සඳහන් නිවේදනය අතර පවතින නීත්‍යානුකූලභාවය පිළිබඳව පැහැදිලි තර්කයක් ගොඩනැගීමට වගඋත්තරකරුවන් අසමත්ව ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාවේදි පවත්වනු ලැබූ පරීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇත්තේ තාක්ෂණවේදය විෂය (දෙමළ මාධ්‍ය) සඳහා අයදුම්පත්‍ර කැඳවන අවස්ථාව වන විට දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු 22 ක් පැවැති බවත්, එම පුරප්පාඩු අතරින් ගුරුවරුන් 02 පමණක් බඳවාගෙන ඇති බවත් මෙම විෂයට අදාළ ගුරු පුරප්පාඩු 20 ක් මේ වන විට පවතින බවත්ය.

ඉහත සඳහන් සියලු කරුණු සලකා බැලීමේදී උතුරු මැද පළාතේ පාසල් වෙත උපාධිධාරී හා ඩිප්ලෝමාධාරී ගුරුවරුන් බඳවා ගැනීම සඳහා පළකළ විධිමත් දැන්වීමේ සඳහන්ව ඇති සුදුසුකම් අනුව පැමිණිලිකරු ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාවක් හදාරා අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයෙකු බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලේඛන ඉදිරිපත් කර තිබියදීත් පැමිණිලිකරු ගුරු පත්වීමක් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා නොමැති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

> ඒ අනුව පැමිණිලිකරු වෙත තාක්ෂණවේදය (දෙමළ මාධ්‍ය) විෂයට අදාළ ගුරු පත්වීමක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමි.

2019.07.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/